# ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කිරීම.

## භූ දර්ශන සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යනු රටවල් 178 ක ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ ගෝලීය සංවර්ධන ජාලයයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන, ජගත් පරිසර පහසුකම - සුළු මූල්‍යාධාර වැඩසටහන (GEF-SGP) යනු සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා මුල්‍යාධාර ලබාදෙන යාන්ත්‍රණයකි.

සුළු මූල්‍යාධාර වැඩසටහන (SGP) 1994 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ මුලපිරීම් උදෙසා ව්‍යාපෘති 400 කට අධික සංඛ්‍යාවක් සඳහා මූල්‍යාධාර ලබා දෙමින් අදියර 6 ක් සාර්ථකව නිම කර ඇත.

හත්වන ක්‍රියාකාරී අදියර (OP-7) මගින් නකල්ස් සංරක්ෂණ වනාන්තරය සහ එහි ස්වාරක්ෂක කලාපය (buffer zone), මන්නාරම සිට යාපනය දක්වා වූ වෙරළබඩ කලාපය සහ කොළඹ ආශ්‍රිත තෙත්බිම් යන පාරිසරික වශයෙන් සංවේදී භූ දර්ශන තුනක් (3) වෙත අවධානය යොමුකර ඇත. මෙම භූ දර්ශන තුල සහභාගීත්ව පරිසර සංරක්ෂණය, ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර ජීවනෝපාය මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම තුළින් සිවිල් සමාජ සංවිධාන ශක්තිමත් කිරීම සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ GEF-SGP වැඩසටහන, වැඩි දියුණු කරන ලද වැඩසටහනක් ලෙස සලකනු ලබන අතර, අනෙකුත් SGP රටවල්, සමහර අංශ සහ භූගෝලීය කලාප වල සුළු මූල්‍යාධාර වැඩසටහනේ අත්දැකීම් වල වාසිය යොදාගනිමින්, එම රටවල් වල හොඳින් දියුණු වූ සිවිල් සමාජයන් සහ වෙළඳපොල ජාලයන් සැලකිල්ලට ගනිමින් ප්‍රජා පාදක භූ දර්ශන ප්‍රවේශයක් වඩාත් පුළුල් ලෙස යොදාගැනීමට මෙහිදී අවස්ථාවක් ලබාදේ.

විශ්ව විද්‍යාල මඟින් පාලනය වන සංවිධාන (සංගම්, සමිති, ආදිය) ඇතුළු සිවිල් සමාජ සංවිධාන (CSOs) හරහා ගෝලීය පාරිසරික ප්‍රතිලාභ සහ දේශීය තිරසාර සංවර්ධන ප්‍රතිලාභ මත පදනම් වූ සහ එමගින් ශක්තිමත් ව ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් හත්වන ක්‍රියාකාරී අදියර, ඉහත ඉලක්ක ගත භූ දර්ශනවල ප්‍රජාවන්ට සහාය වනු ඇත.

හත්වන ක්‍රියාකාරී අදියරෙහි අරමුණ වන්නේ නකල්ස් සංරක්ෂණ වනාන්තරය සහ එහි ස්වාරක්ෂක කලාපය, මන්නාරම සිට යාපනය දක්වා වෙරළබඩ කලාපය සහ කොළඹ ආශ්‍රිත තෙත්බිම් යන භූ දර්ශන තුළ ජෛව විවිධත්ව සංරක්ෂණය, කාබන් තිරකිරීම සහ භූමි හායනය අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා නව්‍ය හා වැඩි පිරිසකට ප්‍රතිලාභ අත්කර දියහැකි ප්‍රජා ව්‍යාපෘති සංවර්ධනය කිරීමයි.

GEF-SGP හත්වන ක්‍රියාකාරී අදියරෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිවිල් සමාජ සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති හරහා පහත ප්‍රතිඵල ළඟා කරගැනීම මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීම මඟින් අපේක්ෂා කෙරේ.

- මෙම එක් එක් ව්‍යාපෘති මඟින් අවම වශයෙන් පහත ප්‍රතිඵල ළඟා කරගත යුතුය.

    a. හෙක්ටයාර 1000 ක ජෛව විවිධත්ව සංරක්ෂණය සහ / හෝ
    b. හෙක්ටයාර 1000ක පාංශු හා ජල සංරක්ෂණය, තිරසාර ඉඩම් කළමනාකරණ පිළිවෙත් තුළින් භූමි හායනය අවම කිරීම සහ හායනයට ලක් වූ ඉඩම් යථා තත්ත්වයට පත් කිරීම.
    c. කාන්තාවන් සහ පිරිමින් සමාන අනුපාතයක් සහිතව ඉලක්ක සෘජු ප්‍රතිලාභීන් 250ක් වීම.

- ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජාවේ සියලු කොටස් නියෝජනය වන පරිදි ප්‍රජා සහභාගීත්වය පැවතීම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල අවම වශයෙන් 50% ක කාන්තා සහභාගීත්වය පැවතීම, වැඩි කාන්තාවන් සංඛ්‍යාවක් මූලිකත්වය ගැනීම, ආන්තික කණ්ඩායම්, ආබාධිත පුද්ගලයින් සහ තරුණයින් නිරත වීම දිරිමත් කිරීම සහතික කිරීම.

- තිරසාර ආදායම් උත්පාදන මැදිහත්වීම් සඳහා කාන්තාවන් සහ අනෙකුත් ආන්තික කණ්ඩායම් ඉලක්ක කරගත් මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සහ භූ දර්ශනයේ සමාජ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති ප්‍රදානලාභියා සමඟ සහයෝගයෙන් අවම වශයෙන් එක් සමාජ ව්‍යවසායක් (social enterprise) ස්ථාපිත කිරීම.

- සුළු මූල්‍යාධාර වැඩසටහන විසින් නම් කරන ලද පුහුණුකරුවන් හරහා ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලීම සඳහා ප්‍රජා මට්ටමේ කිසියම් නිශ්චිත පුහුණුවීම් සහ කුසලතා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රතිඵල වාර්තා කිරීම.

මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීම නකල්ස්, මන්නාරම සහ කොළඹ යන භූ දර්ශන තුන (කරුණාකර ඔබ කැමති භූ දර්ශනය ව්‍යාපෘති යෝජනාවේ සඳහන් කරන්න.) සඳහා ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කල දින සිට දළ වශයෙන් වසර 2 ක කාලයක් සඳහා වේ.

ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රය, ඇගයීම් නිර්ණායක, කාර්ය නිර්ණය සටහන (ToR) සහ වෙනත් උපකාරක තොරතුරු **https://www.undp.org/srilanka/projects/gef-small-grants-programme** යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

ව්‍යාපෘති යෝජනාවන් **2023 මැයි මස 21** වන දින හෝ ඊට පෙර, **ජගත් පරිසර පහසුකම - සුළු මූල්‍යාධාර වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, අංක 202-204, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට තැපෑලෙන් හෝ gefsgp.lk@undp.org යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. වැඩි විස්තර සඳහා කරුණාකර GEF-SGP කාර්යාලය අමතන්න. දු.ක: 011 2580692 දිගුව: 1421 හෝ 1422 හෝ 071-2854510.

උනන්දුවක් දක්වන සියලුම සිවිල් සමාජ සංවිධාන සඳහා භූ දර්ශන උපාය මාර්ගය, ජෛව විවිධත්වය (BD)/ භූමි හායනය (LD)/ දේශගුණ විපර්යාස (CC) පිළිබඳ ක්‍රියාකාරී සැලසුම්, නීති සහ ව්‍යාපෘති යෝජනා සංවර්ධනය පිළිබඳ මූලික පුහුණුව ඇතුළත් දැනුවත් කිරීමේ වැඩමුළු මාලාවක් සංවිධානය කරනු ලැබේ. මෙම දැනුවත් කිරීමේ වැඩමුළු භූ දර්ශන මට්ටමින් සහ අන්තර්ජාලය හරහා සිදු කෙරේ.

මේ සඳහා සහභාගී වීම අනිවාර්ය නොවන අතර, ව්‍යාපෘති යෝජනා තේරීම් ක්‍රියාවලියට කිසිදු බලපෑමක් සිදු නොවේ. දැනුවත් කිරීමේ වැඩමුළු පිළිබඳ වැඩි විස්තර සඳහා පහත සබැඳිය බලන්න.

*https://drive.google.com/drive/folders/1-vcji_Na9bODtCYra6ENzOa521_49au7?usp=share_link*

අවශ්‍ය සංවිධාන කටයුතු සූදානම් කිරීම සඳහා කරුණාකර ඉහත පුහුණුවීම් සඳහා ඔබගේ සහභාගීත්වය 2023 අප්‍රේල් 12 වන විට gefsgp.lk@undp.org විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ලිපියක් එවීමෙන් තහවුරු කරන්න.

**මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අපේක්ෂකයන් හට පමණක් ජාතික මෙහෙයුම් කමිටුවේ වැඩිදුර ඇගයීම හා නිර්දේශ කිරීම සඳහා GEF-SGP කාර්යාලය මගින් දන්වනු ඇති බව කරුණාවෙන් සලකන්න.**